**සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2023**

**----------------------------------------------------------**

සෞඛ්‍ය **පද්ධති** වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2018 ඔක්තෝබර් 26 දිනැතිව ඇති කර ගත් අංක 3727 SRI (COL) දරන ණය ගිවිසුම සහ 2018 ඔක්තෝබර් 26 දිනැතිව ඇති කර ගත් අංක 0618 – SRI (SF) දරන දීමනා ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට සහ දීමනා ගිවිසුමට අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මධ්‍යම, උතුරු මැද, සබරගමුව සහ ඌව යන පළාත් සභා හතර මෙම ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ගුණාත්මක අත්‍යාවශ්‍ය සෞඛ්‍ය සේවා සඳහා විශ්වීය ප්‍රවේශය සහ අඛණ්ඩ සත්කාර සැපයීමේ සංකල්පය මත පදනම්ව ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතියේ කාර්යක්ෂමතාව, සාධාරණත්වය සහ ප්‍රතිචාර දැක්වීම මෙම ව්‍යාපෘතිය මගින් වඩිදියුණු කරනු ඇත. ණය සහ ප්‍රදාන ගිවිසුම්වලට අනුව අනුපිළිවෙලින් සහනදායී ණය වශයෙන් රු. මිලියන 5,813 ට සමාන එ.ජ.ඩො. මිලියන 37.5 ක් සහ රු. මිලියන 1,938 ට සමාන එ.ජ.ඩො. මිලියන 12.5 ක ප්‍රදානයකින් සමන්විත වන එකතුව රු. මිලියන 7,751 කට සමාන එ.ජ.ඩො. මිලියන 50 ක් ලබා දිමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2018 **දෙසැම්බර්** 01 වන දින ආරම්භ කරන ලද අතර 2023 නොවැම්බර් 30 දින වන විට එම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණි.

## 1.3 මතය

2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිතිඅනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරනලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම් කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳවපාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 වගන්තිය | ප්‍රසම්පාදන සැලැස්මට අනුව දඹුල්ල මහ රෝහල සඳහා අල්ට්‍රා සවුන්ඩ් ස්කෑනර් හයි එන්ඩ් යන්ත්‍රය ප්‍රසම්පාදනය සමාලෝචිත වර්ෂයේ දෙවන කාර්තුව වන විට අවසන් කළ යුතුව තිබුණි. කෙසේ වෙතත් සැලැස්මේ සඳහන් කාල සීමාවෙන් මාස 11ක ප්‍රමාදයක් සිදුව තිබුණද ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කර නොතිබුණි. | 2022 වසරේ අග භාගයේ සහ 2023 වසරේ මුල් භාගයේ අත්‍යවශ්‍ය වෛද්‍ය සැපයුම් සඳහා ප්‍රතිපාදන යෙදවීම හේතුවෙන් මුලින් සැලසුම් කළ පැකේජවලින් ප්‍රසම්පාදනය කිරීමේ ප්‍රමුඛතාව ප්‍රමාද විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල විය යුතුය |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන කොන්දේසි අනුව, සැබෑ උපදේශන සේවා කාලය 2023 මාර්තු සිට 2024 ජුනි දක්වා (මාස 15) විය යුතුය. කෙසේ වෙතත් විගණන දිනය වන විටත් ජාතික බෝවන රෝග පිළිබඳ ආයතන සංකීර්ණය ඉදිකිරීම සඳහා උපදේශන සමාගමක් තෝරාගෙන නොතිබුණි | ජාතික බෝවන රෝග පිළිබඳ ආයතනය (NIID) සඳහා නව රසායනාගාරයක් ඉදිකිරීමේ අධීක්ෂණය සහ පළාත් හතරේ සිවිල් කටයුතුවල ඉතිරි අධීක්ෂණ කටයුතු සඳහා උපදේශන කටයුතු සඳහා කැමැත්ත විමසන ලදී. පළාත් හතරක සිවිල් වැඩ අධීක්ෂණ කටයුතුවල ඉතිරි කටයුතු සඳහා යෝජනා කැඳවා ඇති අතර තාක්ෂණික ඇගයීම් කටයුතු වලින් අනතුරුව කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද උපදේශක ප්‍රසම්පාදන කමිටුව විසින් මිල ගණන් විවෘත කර ඇගයීමට ලක් කරන ලද අතර මිල ගණන් ඇස්තමේන්තුගත පිරිවැයට වඩා වැඩි බැවින් සහ අරමුදල් නොමැතිකම හේතුවෙන් උපදේශන කාර්යයේ ක්‍රියාවලිය නැවැත්වීමට සහ උපදේශන කටයුතු සඳහා පවතින අනෙකුත් විකල්ප සලකා බැලීමට තීරණය කරන ලදී. | නියමිත කාලය තුළ කාර්යයන් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 මතභේදාත්මක ගනුදෙනු**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ඌව, සබරගමුව, උතුරු මැද සහ මධ්‍යම පළාත්වල රෝහල් සඳහා අතේ ගෙන යා හැකි අල්ට්‍රා සවුන්ඩ් ස්කැනර් යන්ත්‍ර 18ක් මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 48.6ක් ඇස්තමේන්තු කර තිබුණි. මේ සඳහා පළමුවර කැඳවන ලද ලංසු අවලංගු කර තිබුණු අතර දෙවන වර ලංසු කැඳවීම අනුව අවම ලංසුව රු. මිලියන 88ක් හෙවත් ඇස්තමේන්තු වටිනාකමට වඩා සියයට 81ක් වැඩිය. තවද මිලදී ගත් යන්ත්‍ර සංඛ්‍යාව 22 දක්වා වැඩි කර තිබුණි. කෙසේ වෙතත් පළමු වර කැඳවූ ලංසුව අවලංගු කිරීමට හේතු විගණනයට ඉදිරිපත් නොවීය. | ලංසු වලංගු කාලය අවසන් වීමට පෙර පැකේජය සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාව ලබා ගැනීමට ව්‍යාපෘතියට නොහැකි විය. එබැවින් පැකේජය අවලංගු කර ආසියානු සංවර්ධන බැංකුවෙන් නැවත ලංසු කැඳවීම සඳහා අනුමැතිය ලබාගෙන ඇත. Apex රෝහල්වල අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණය වැඩි කරන ලද අතර එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් රුපියලෙන් ලැබුණු වාසිය තුළින් පැකේජයේ අමතර පිරිවැය පියවා ගැනීමට හැකි විය. | ප්‍රසම්පාදනය වෙන් කර ඇති සීමාව තුළ සිදු කළ යුතුය. |
| (ආ) | මහජන සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් 2021 වර්ෂයේදී රුපියල් මිලියන 87ක් වැය කර වෑන් රථ 09ක් මිලදී ගෙන ඇතත් එම වෑන් රථවල සවි කළ යුතු ඇමතීම් පද්ධති මිලදී නොගත් නිසා එම වෑන් රථ මිලදී ගත් කාර්යයට නොයොදා වෙනත් කටයුතු සඳහා භාවිතා කරන බව නිරීක්ෂණය විය. | අපේක්ෂිත අරමුණු සඳහා මෙම වාහන භාවිතා කිරීම ව්‍යාපෘතියේ පාලනයෙන් ඔබ්බට ගිය කටයුත්තකි. අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වාහන භාවිතා කිරීම සහතික කළ හැක්කේ සෞඛ්‍ය අමාත්‍යාංශයට සහ පළාත් සෞඛ්‍ය බලධාරීන්ට පමණි. | වත්කම් අපේක්ෂිත අරමුණු සඳහා උපයෝගී කර ගත යුතුය. |